ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

80 වර්ෂය - ශ්‍රී බු: ව 2570 2026 ජූලි 29 ඇසළ කළාපය

ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරය,
ඓතිහාසික යටගල රාජමහා විහාරය ප්‍රමුඛ අෂ්ඨ මහා විහාරාධිපති,
දක්ෂිණ ලංකාවේ සමථ බල සම්පන්න ප්‍රධාන අධිකරණ සංඝනායක
සද්ධර්ම කීර්ති ශ්‍රී රතනසාර,
කොළඹ නාලන්ද විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

"වෙසෙසින් දකිමු"

"කුම්භූපමං කායමිමං විදිත්වා - නගරූපමං චිත්තමිදං ඨපෙත්වා
යෝධේථ මාරං පඤ්ඤාවුධේන -ජිතං ච රක්ඛේ අනිවේසනෝ සියා"
(ධම්ම පදය - චිත්ත වග්ග)

මේ කය කළයක් මෙන් ද, සිත නගරයක් මෙන් ද, සලකා ප්‍රඥාව නමැති ආයුධයෙන් මාරයා සමග යුධ කොට පරාජය කරන්න. තමා ලැබූ ජය රැකගන්න. සමාපත්තියෙහි නො ඇලෙන්න.

මහ බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීම, සිදුහත් කුමරු මහාභිනිෂ්ක්‍රමණය කිරීම, මංගල ධර්ම දේශනය, ලංකාවට දළදා වහන්සේ වැඩම කරවීම ඇතුළු වැදගත් ආගමික සිදුවීම් රැසක් මෙම පොහොය දිනයෙහි සමරනු ලැබේ. ඒ තොරතුරු ඕනෑවටත් වඩා ඔබ දන්නා බැවින් මෙහි සඳහන් නොකරමි.

බුදුරජාණන්වහන්සේ ඉහත මාතෘකා කරගත් ධර්මදේශනාව වදාළේ විදර්ශනා භාවනාවෙහි යෙදී සිටි පන්සියයක් පමණ වූ භික්ෂූන් උදෙසාය. බුදුරජාණන්වහන්සේගෙන් අර්හත්වය දක්වා කමටහන් ලබාගත් මේ භික්ෂූ පිරිස සැවත් නුවර සිට යොදුන් සීයක් මඟ ගෙවා ඇත පිටිසර ගමකට

පැමිණියහ. ගම්වැසියෝ ඒ භික්ෂූන්ට ඒ අසල ඇති වනාන්තරයක ආවාස පහසුව සලසා දී සිව්පසයෙන් උපස්ථාන කළහ. ගම්වැසියොත් තිසරණයෙහි පිහිටා සිල් රැකීමට යොමු වුහ.

මේ වනයෙහි ගස් වල විමාන තනාගෙන සිටි දේවතාවෝ මේ භික්ෂූන් අද යතැයි හෙට යතැයි සිතා සිටියත් එය ඉටු නොවූ නිසා විවිධ හොල්මන් කළහ. බුදුරජාණන්වහන්සේ කරණීය (මෙත්ත) සූත්‍රය වදාළේ එම සිදුවීම අරමුණු කොට ගෙනය. ඒ කතාව ඔබ දනී. භික්ෂූන්ගේ මෛත්‍රී විහරණය නිසා දේවතාවෝ විරුද්ධකම් කිරීම නවතා සංග්‍රහ සත්කාර කිරීමට යොමු වුහ. පැවති සම්බාධ දුරුවීමත්, ප්‍රත්‍ය පහසුව ලැබීමත් නිසා ඒ භික්ෂූහු විදර්ශනා කමටහන් වඩන්නට පටන් ගත්හ. ඔවුන්ගේ විදර්ශනාව හොඳින් වැඩීගෙන එනවිට බුදුරජාණන්වහන්සේ දිවැසින් ඒ බව දැක ඔවුන් ඉදිරියෙහි සෘද්ධියෙන් පෙනී සිටිමින් ඉහත සඳහන් ගාථාවෙන් ධර්ම දේශනා කළහ.

සියලු නාම රූප ධර්මයන්ගේ පටිච්චසමුප්පන්න පැවැත්ම හා අනිත්‍ය ස්වභාවය පෙන්වා දෙමින් මේ ශරීරය වළං තනන්නෙකු විසින් හදන ලද කළයක් මෙන් කොයි මොහොතක හෝ බිඳී යා හැකි බවත්, එහි මම මගේ කියා අල්ලා ගන්නට කිසිවක් නැති බවත්, අපේ සිත සොරුන් විසින් වටලන ලද නගරයක් නුවරුන් විසින් රැක ගන්නා සේ කෙලෙස් සතුරන්ට ඇතුළු වන්නට නොදී රැක ගත යුතු බවත්, රැක ගත් සිතට නැවත නැවත කෙලෙස් වලට ඇතුළු වන්නට නොදී නුවණ නමැති අවියෙන් සතුරන් පරාජය කොට, ලබාගත් ජය රැකගත යුත බවත් බුදුහු මෙහිදී පෙන්වා දුන්හ.

නාම - රූප ධර්මවල අපට පෙනෙන්නේ ඒවායේ යථා ස්වභාවය නෙවෙයි. බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන් අපගේ නෙත, කන, නාසය, දිව ගත රවටනවා මාරයාගේ බලපෑම කියන්නේ ඒකට. බුදුහාමුදුරුවෝ මෙහිදී සිත 'නගරයකට' උපමා කළහ. නගරයෙහි වටිනා වස්තු එක් රැස් කොට ඇත. සිතෙහි බෝධිපාක්ෂික ධර්ම නැමති වටිනා වස්තු ඇත. නගරයෙහි ඇති වස්තුව පැහැර ගැනීමට සොර සතුරෝ මාන බලති. බෝධිපාක්ෂික ධර්ම වනසා දැමීමට මාරයා මාන බලයි. නගරයට කඩාපනින සොර සතුරන් පලවා හැරීමට නුවරු ආයුධ දරති. සිතට එන මාර බලවේග පලවා හැරීමට සතර සමාපත්තියෙන් ගොඩනගාගත් පඤ්ඤාව නමැති ආයුධය ඇත. තමන් දිනවා යයි සිතා ඉදිරියට එන අනතුරට සැලකිලිමත් නොවී සිටියොත්, කා බී ප්‍රීති වන්නට ජය සමරන්නට යොමු වුණොත් නුවරුන්ගේ ඒ ප්‍රමාදය බලා සතුරෝ යලි පහර දෙති. යෝගියා තමා තුළ මතු වන තරුණ විදර්ශනා ඥානය නොරැක සතර සමාපත්තිවල සුව විඳිමින් සිටියොත් මාරයා නැවත පහර දෙනු ඇත. නුවරුන් රැකවල් තර කරන්නා සේ යෝගියා සතර සතිපට්ඨානයෙන් සිතට රැකවල් සලසයි.

ලෝකය සකස් වී ඇත්තේ සතර මහා ධාතූන්ගේ සම්මිශ්‍රණයෙනි. එහෙත් ඒ සම්මිශ්‍රණය අපට නොපෙනේ. මේ මමය අර අනෙකාය, මේ ස්ත්‍රීයය, මේ පුරුෂයාය, මේ මවය, මේ පියාය, මේ පුතාය, මේ මගේ නිවසය යනාදී වශයෙන් වැරදි චිත්‍රයක් අපේ මනසට දැනේ. තිරිඟු පිටිවලින් පාන්, බනිස්, බිස්කට් වැනි විවිධ දේ හැදූ විට අප ඒවා ඒ ඒ නම්වලින් හඳුනා ගන්නවා මිස තිරිඟු පිටි වශයෙන් හඳුනා ගැනීමක් නොකරයි. ඇඳ, පුටු, මේස දුටුවත් ඒවා ගසක ලී වලින් තනා ඇති බව නොපෙනේ. ඇත්තටම බැලුවොත් මෙහි ඒ ඒ නම්වලින් හඳුන්වන කිසිවෙක් හෝ කිසිවක් හෝ නැත. සියලු දෙනා රැවටෙන්නේ මාරයාගේ

මායාවටය.

මේ ශරීරයේ ඇතුළත දුටුවොත් දින කිහිපයක් යන තුරු ආහාර ද අප්‍රිය වේ. මේ ශරීරය මුඛය නැමති එක් දොරටුවකින් ඇතුළු කරන රසවත් ආහාර පාන, ගඳ ගසන අසුචි බවට පත්ව නවදොරකින් එළියට එයි. ඒවා ඒ ඒ වේලාවට සෝදා පිරිසිදු නොකළොත් අපේ ශරීරයේ ගඳ අපටම දැනේ. අතිශය දුගඳ හමන සිඟන්නන් බස්රිය, දුම්රිය වලදී ඔබට හමුවී ඇත. මේ ශරීරය කණපිට හැරෙව්වොත් ඒ කරා එන බල්ලන්, කපුටන් පලවා හැරීමට පොල්ලක් අතින් ගෙන රැක සිටීමට සිදුවේ. අසුචි පිරුණු මේ ශරීරවලට අනුවණයෝ ආස කරති. ළං කර ගනිති. කැන්දාගෙන එති. නවීන විලාසිතාවල ඇඳුම් වලින් වසති. සුවඳ ඇඟේ ගා ගනිති. දිනපතා නාවති. කෙස් රැවුල් කපති. කවති. පොවති.

තාවකාලික ලැබෙන සැපයෙහි ඇලී බොහෝ වූ දුකට උරුමකම් ඇති කර ගනිති. මිහිරි ගීයෙන් කන් පිණවති. රස අහරින් දිව පිණවති. ලස්සන යැයි සිතන දේ බලති. සුවඳ විලවුන් ආලේප කරති. මේ මිථ්‍යාව දුරුකොට නාම - රූප දෙකෙහි යථා ස්වභාවය නුවණින් දැකිය යුතුය. එය විපස්සනාවයි. "විසේසේන පස්සතීති විපස්සනා" යන නිර්වචනයට අනුව හැමෝම බලන ආකාරයට නොව අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන තුන් ආකාරයෙන් නාම රූප දෙක බැලිය යුතුය.

I. අනිච්චානුපස්සී - නාමරූප ධර්මයන් ස්ථිරවම නොපවතී.
නිතර වෙනස් වේ අන්‍ය ස්වභාවයට පත්වේ. අපේ ඇසට ගෝචර වන රූපය ඒ ක්ෂණයෙහිම විනාශ වී යයි. එයින් තවත් රූප හට ගනියි. අප සිතා සිටින්නේ දැන් පවත්නා රූපයම අප දුටුවාය කියායය. අපේ ඇස ද, ඇසට පෙනෙන රූප සලකුණු ද ක්ෂණයක් පාසා වෙනස් වෙමින් පවතියි. මෙය අනිත්‍ය හෙවත් නිත්‍ය නොවන බවයි. සමහර ධර්ම විකෘතිකයෝ 'අනිච්ඡ' යයි මෙය වැරදියට තෝරා වැරදි අර්ථ දෙති. 'අනිච්ඡ' යන්න ත්‍රිපිටකයෙහි නැත. ඇත්තේ 'අනිච්ච' කියායය.

II. දුක්ඛානුපස්සී - මෙය අනිත්‍ය බව නිසා ඇතිවන ඵලයකි.
ඉන්ද්‍රිය ගෝචර වන අරමුණු වලට තණ්හාවෙන් බැඳි ඒවායින් සතුටක්, විනෝදයක්, සහනයක් බලාපොරොත්තු වුණත් වෙනස් වීමේ ධර්මතාව නිසා අප බලාපොරොත්තු වන දේ අපට ලැබෙන්නේ සුළු මොහොතකට පමණි. සිතින් අල්ලාගත් දේ කැඩෙන, බිඳෙන, මැරෙන විට අපට දුක උපදී.

III. අනත්තානුපස්සී - අරමුණු සුබ වශයෙන් ගන්නා විට ඒවා
'මගේ' කියා සිතෙයි (=ඒතං මම) ඒ අරමුණු දකින ආඝා රස විඳින 'මම' මෙහි සිටිමි ඒ අරමුණු රස විඳින්නා මම වෙමි. (= ඒසෝ අහං අස්මි) යනුවෙන් මම කියා කෙනෙක් ඇතැයි අපට සිතේ. එවිට 'මේ මගේ ආත්මයයි. යනුවෙන් (ඒසෝ මේ අත්තා) අප තුළ ආත්ම දෘෂ්ටිය, සක්කාය දිට්ඨිය ඇතිවේ.

මේ ආකාරයට සියලු නාම - රූප ධර්මයන්ගේ ත්‍රිලක්ෂණය තමා තුළත් බාහිර ලෝකය තුළත් ප්‍රඥාවෙන් දැකීම විපස්සනාවයි. අනෙක් අය දකින්නේ නිත්‍ය, සුඛ, ආත්ම වශයෙනි

විදර්ශනා වඩන්නා අනිච්ච, දුක්ඛ, අනත්ත වශයෙන් දකී. ධර්මය විකෘති කරන සමහරු මෙය 'අනත්ථ' යනුවෙන් වැරදියට හඳුන්වමින් වැරදි මතයක් ප්‍රකාශ කරති.

ප්‍රඥාව නමැති ආයුධයෙන් (පඤ්ඤාවුධේන) කෙලෙස් සතුරන් මැඩ පවත්වන්නේ මෙසේ ත්‍රිලක්ෂණයට අනුව බැලීමෙනි. අටුවාවට අනුව විදර්ශනා ප්‍රඥාව, මාර්ග ප්‍රඥාව යනුවෙන් මෙහි කොටස් දෙකක් ඇත. දැකීම සම්පූර්ණ වන්නේ මාර්ග ප්‍රඥාවෙනි. විදර්ශනා ප්‍රඥාවෙන් කෙලෙසුන් තදංග ලෙස යටපත් වේ. මාර්ග ප්‍රඥාවෙන් කෙලෙස් ප්‍රහානය වේ. මේ නිසා මේ දෙක ආයුධ ලෙස හඳුන්වා ඇත.

මෙම ගාථාවේ 'ජිතං ච රක්ඛේ' යනුවෙන් වදාරා ඇත්තේ විදර්ශනා ප්‍රඥාව රැක ගතයුතු බවයි. විදර්ශනා ප්‍රඥාව ඇති කරගත් මුල් අවස්ථාවේදී එය රැකගැනීම යෝගාවචර භික්ෂුව මහත් වෙහෙසක් ගත යුතුය. එය නැවත නැවත පුරුදු නොකළ හොත් පිරිහී යා හැකිය. විදසුන් නුවණ ඇතිකර ගැනීමටත් රැක ගැනීමටත් භික්ෂුවට මිහින්තලය, සිතුල්පව්ව වැනි නිහඬ පරිසරයක් අවශ්‍යය. ප්‍රමාණවත් ආහාර, ශීත උෂ්ණ ආදියෙන් පීඩා නොලැබීම, භාවනාවේ ගැටළු විසඳා දෙමින් මඟ පෙන්වන කල්‍යාණ මිත්‍රයෙක් හෙවත් ගුරුවරයෙක් සිටීම අවශ්‍යය. ඔහුගෙන් විදර්ශනාවට නැඹුරු වීමට අවශ්‍ය දහම් ඇසීමට අවස්ථාව තිබිය යුතුය.

සතරවන ධ්‍යාන සමාපත්තිය ලබා සිටීම විදර්ශනා ප්‍රඥාව උපදවා ගැනීමට උපකාර වේ. එහෙත් සමාපත්තියෙහි තිබෙන ධ්‍යාන රසයට ඇලුණොත් එයම විඳිමින් සිටීමට හිතෙන නිසා එහි නොඇලී විදර්ශනාවට සිත යොමු කළ යුතුය. ඒ සඳහා නිතර නිතර සමාපත්තියට සම වදිමින් ඉන් නැගිටිමින් මනස නිරවුල් ව පවත්වාගෙන යා යුතුය. 'අනිවේසනෝ සියා) යනුවෙන් වදාරා ඇත්තේ එම කාරණයයි. බුදුරජාණන්වහන්සේ සෘද්ධියෙන් පෙනී සිටිමින් වදාළ මේ දේශනාව අසා ඒ පන්සියක් භික්ෂුහු රහත් වූහ. ධ්‍යාන සමාපත්තිය සමථ භාවනාවට අයත් වන බැවින් බුදුරජාණන්වහන්සේ නිවන් දැකීම සඳහා අවශ්‍ය විදර්ශනා භාවනාවට භික්ෂූන් යොමු කරවීමට මෙම ගාථාවෙන් ධර්ම දේශනා කළහ.